00040

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා ) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESU3128 - අධ්‍යාපනයෙහි මාර්ගෝපදේශනය හා උපදේශනය**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2014.02.27** **වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30**

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. උපදේශනය යන්න විද්‍යාත්මක සහ දිශාභිමුඛ නොවූ ක්‍රියාවලියක් ලෙස සලකන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

02. I. පාසල් සන්දර්භයට සෘජුවම බලපාන උපදේශනයේ ප්‍රධාන ක්ෂේත්‍ර තුන (03) නම් කරන්න.

    II. ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. අධික්‍රියාකාරී හැසිරීම් සහිත දරුවෙකු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සහභාගී කරවීම සඳහා ගත හැකි උපාය මාර්ග තුනක් (03) පැහැදිලි කරන්න.

04. නව යොවුන් වියේ සිසුන්ට උපදේශනයේ හා මාර්ගෝපදේශයේ අවශ්‍යතාව කරුණු තුනක් (03) ඇසුරින් පැහැදිලි කරන්න.

05. උපදේශන සේවා ශිල්ප ක්‍රම භාවිතයේ වැදගත්කම කරුණු දෙකක් (02) ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

06. I. උපදේශනයට අදාළ සච්චාරිත්‍ර ධර්ම 2 ක් දක්වන්න.

    II. උපදේශනයට අදාළ සච්චාරිත්‍ර ධර්ම රැක ගැනීමේ වැදගත්කම සැකෙවින් පෙන්වා දෙන්න.



2

07. පාසලකට වෘත්තිය මාර්ගෝපදේශ සේවයක අවශ්‍යතාව පෙන්වීමට කරුණු දෙකක් (02) ඉදිරිපත් කරන්න.

08. මනෝ විශ්ලේෂණ න්‍යායට අනුව පුද්ගලයා ගැටලුවලට මුහුණ දෙන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

II වන කොටස

09. I. සමායෝගී වීමට බලපෑ හැකි පහත දැක්වෙන සාධක දෙක උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

i. පාසල ආශ්‍රිත සාධක

ii. කායික සාධක

(ලකුණු 10)

II. සමායෝගී වීමට අපොහොසත් වීමේ ගැටලුව අධ්‍යාපනික ගැටලුවක් වන්නේ කෙසේ ද?

(ලකුණු 10)

10. "අන් කවරෙකුටත් වඩා උපදේශන හා මාර්ගෝපදේශ සේවයක් අවශ්‍ය වන්නේ විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ය."

උක්ත ප්‍රකාශය උදාහරණ සහිතව සනාථ කරන්න. (ලකුණු 20)

11. I. උපදේශනයේ ප්‍රධාන ප්‍රවේශ 5 නම් කරන්න. (ලකුණු 05)

II. ඉන් ප්‍රවේශ දෙකක මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

III. උපදේශකවරයෙකුට උපදේශන ප්‍රවේශ සම්බන්ධ දැනුම වැදගත් වන්නේ ඇයි දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 05)

12. I. උපදේශන සේවයක් සංවිධානය කළ හැකි පහත දැක්වෙන ක්‍රම දෙක වෙන වෙන ම පැහැදිලි කරන්න.

අ. මධ්‍යගත ආකෘතිය

ආ. විමධ්‍යගත ආකෘතිය

(ලකුණු 10)

II. "වඩා කාර්යක්ෂම උපදේශන සේවයක් ගෙන යාමට නම් වඩා සුදුසු වන්නේ සමෝධානිත උපදේශන සේවා සංවිධාන යයි."

උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

13. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. පායෝනියන් ආකෘතිය
2. උපදේශනය හා මාර්ගෝපදේශය අතර වෙනස
3. උපදේශනයට අදළ මඟ පෙන්වීම්
4. ඉගෙනුම් දුෂ්කරතා

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.